# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2191/6 - 2020 අගෝස්තු මස 31 වැනි සඳුදා - 2020.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව**

**සංශෝධන අංක 03**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1982/15 හා 2016.08.30 දිනැති සහ අංක 2050/43 හා 2017.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත, අංක 1894/26 දරන 2014.12.26 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**එම්. ඒ. බී. දයා සෙනරත්**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2020 අගෝස්තු මස 20 වැනි දින
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේදී ය.

**සේවා ව්‍යවස්ථාවේ 7.2.2.1 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) **දෙවරකට නොවැඩි වාර ගණනකදී** සමත්වීම.

**සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 02 න් සංශෝධිත 7.3.1.2.1 (4) වගන්තිය ඉවත් කරනු ලැබේ.**

**සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 02 හි 7.3.2.2.3 (අ) (i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

සේවයේ 3 පන්තිය I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සේවා ව්‍යවස්ථාවේ 7.3.2.2.3 (ආ) (i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

සේවයේ 3 පන්තිය III ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පත්වීම ස්ථිර කළ නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 02 න් සංශෝධිත 7.4.1.2.1 (3) වගන්තිය ඉවත් කරනු ලැබේ.**

**සේවා ව්‍යවස්ථාවේ 7.4.2.2.3 (1) (අ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 7.4.2.2.3 (2) (අ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

2 පන්තියේ II ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පත්වීම ස්ථිර කල නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 (iv) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 10.2.1.1 (iii) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 10.3.1.1 (iv) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 10.4.1.1 (iv) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**සේවා ව්‍යවස්ථාවේ 10.5.1.1 (iii) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

09 - 329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.